Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය- 2

විෂය:- නර්තනය

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

## ප්‍රශස්ති කාව්‍ය හා සබැඳි සංස්කෘතික පසුබිම

මහනුවර යුගයේදී වඩාත්ම ජනප්‍රිය වූ කාව්‍ය විශේෂයක් ලෙස ප්‍රශස්ති කාව්‍ය හැඳින්විය හැක. බුදුන්, දෙවියන්, රජවරුන් සහ රදළ ප්‍රභූන් ආදීන්ගේ ගුණ වර්ණනා කිරීම සඳහා මෙම කාව්‍ය විශේෂය රචනා කර ඇත.මුල්ම සිංහල ප්‍රශස්ති කාව්‍ය ලෙස **පැරකුම්බා සිරිත** පිළිගැනෙන අතර

- ශ්‍රී නාමය
- පවන
- නරේන්ද්‍රසිංහ වර්ණනාව
- ශෘංගාලංකාරය
- ශ්‍රී වික්‍රමාලංකාරය
- ඇහැලේපොළ වර්ණනාව ආදිය ප්‍රශස්ති කාව්‍ය ග්‍රන්ථ කිහිපයෙකි.මහනුවර යුගයේ කවිකාර මඩුවේ රජුගේ ගුණ ගායනා කිරීම සඳහා වන්දි භට්ටයන් විසින් ප්‍රශස්ති කවි ගායනා කර ඇත.

- රාජ ප්‍රශස්ති
- බුද්ධ ප්‍රශස්ති
- දේව ප්‍රශස්ති වශයෙන් වර්ගීකරණය කර ඇත.

මාත්‍රා 2+3 (සුළු මැදුම් දෙතිත)

පානා අසිරි නොහැර බානා දෙනෙත් කුසුම
බානා පියෙව් බලැති තුංක මේ
නූනා වැළඳි කමල යානා සඳෙද සදෙව්
වීනා සපිරි සිරිනි සංක මේ
පීනා සමර සයුර නානා නතන නතබ
ගානා තෙදිගු නෙතග කුංකු මේ
සේනා සමග මෙලක නානා සිරින් පවතු
බුවනාදිපති රාජසිංහ මේ

මාත්‍රා 4 තාලය (මහ තනි තිත)

චන්ද නම් යස තේජ කුංකුම ඇන්ද දිඟනන් උරතල

බින්ද සතුරු අඳුරු පැහැර බන්දු කමල සේ

නන්ද විජය ශ්‍රී වික්‍රම රාජසිංහ නම් අප හිමි

ඉන්ද්‍ර සිරින් නිති රැක දෙන් කන්ද සුරිඳුනේ

රාම චන්ද්‍ර විය කුල නාම ගගන තල බබළන

රාජ මෙතුම් සිංහල කවි භෝජ රාජනේ

තේජ විකුම් යුතු වික්‍රම රාජසිංහ සිරි නම් දැරූ

රාජ රත්නමය අප හිමි රාජ රාජනේ

මාත්‍රා 2+3 ^ \ ^ \

| මාත්‍රා | 1 2 | 1 2 3 | 1 2 | 1 2 3 |
|---|---|---|---|---|
| බෙර පදය | දොං - | ජිං - ත | ග ත | දොං - ත |
| කවිය | පා - | නා - අ | සි රි | නො හැ ර |
| | පා - | නා - දෙ | නෙත් - | කු සු ම |
| | බා - | නා - පි | යෙව් - | බ ලැ ති |
| | තුං ක | මේ - - | - - | - - - |
| | බා - | නා - පි | යෙව් - | බ ලැ ති |
| | තුං ක | මේ - - | - - | - - - |

පැවරුම

ප්‍රශස්ති කාව්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න

ප්‍රස්තාර සටහනේ ඉතිරි පද කොටස් සම්පූර්ණ කිරීමට උත්සාහ ගන්න.

ප්‍රස්තාර සටහනට අනුව ගායනා කිරීමට යොමු වන්න